## ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

# මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය - පෑලියගොඩ

ප්‍රසම්පාදන අංකය : CFMC/MT/Admin/2025/RMU LP 01

## පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ අංක 02 ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ ඇති RMU 06 සහ RMU 07 දරණ බදු පරිශ්‍රයන් දෙක බදුදීම සඳහා ලංසු කැඳවීම - 2025

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ කළමනාකරණ භාරයක් මඟින් පාලනය වන පෑලියගොඩ පිහිටි මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ අංක දෙක ගොඩනැගිල්ලේ පළමු මහලේ ඇති **RMU 06 සහ RMU 07 දරණ බදු පරිශ්‍රයන් දෙක**, ධීවර කර්මාන්තය ආශ්‍රිත ව්‍යාපාරික කටයුත්තක් හෝ එයට අනුබද්ධ වෙනත් කටයුත්තක් සඳහා වර්ෂ පහක කාලසීමාවකට බදුදීමට පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරයේ සභාපති විසින්, 2025.04.22 පෙ.ව. 10.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

1. උප ලේඛනය

| | බදු දෙන දේපල විස්තර | බදු කාලසීමාව | ලංසු මුදල (මාසික) | ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තුව | ආපසු ගෙවන ටෙන්ඩර් ඇපය |
|---|---|---|---|---|---|
| 01. | පෑලියගොඩ පිහිටි මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ අංක දෙක ගොඩනැගිල්ලේ පළමු මහලේ ඇති RMU 06 දරණ කාර්යාල කාමරය.<br><br>ප්‍රමාණය වර්ගඅඩි 24.16 | වසර 05 | රු.30,000.00 | රු.500.00 | රු.25,000.00 |
| 02. | පෑලියගොඩ පිහිටි මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ අංක දෙක ගොඩනැගිල්ලේ පළමු මහලේ ඇති RMU 07 දරණ කාර්යාල කාමරය.<br><br>ප්‍රමාණය වර්ගඅඩි 24.16 | වසර 05 | රු.30,000.00 | රු.500.00 | රු.25,000.00 |

2. ලංසු ඉදිරිපත් කළ යුත්තේ අංක 83/1, මීගහවත්ත පාර, පෑලියගොඩ යන ලිපිනයෙහි පිහිටා ඇති පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ පරිපාලන කාර්යාලය වෙතින් 2025.04.02 වන දින සිට 2025.04.21 වන දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා ලංසුකරු විසින් තම ලිපි ශීර්ෂය සහිත වූ ලිපියකින් ඉල්ලුම් කර ලබා ගත් ආකෘති පත්‍ර මඟින් පමණි.

3. ලංසු පත් ලබා ගැනීමට පෙර ආපසු නොගෙවනු ලබන රු.500/- ක ගාස්තුවක් පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරයේ ගිණුම් අංක 71446342 දරණ ලංකා බැංකු ගිණුමෙහි තැන්පත් කර අදාළ තැන්පතු පත පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ පරිපාලන කාර්යාලයේ ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර ලදුපතක් ලබා ගත යුතුය.

4. සියලුම ලංසු සමග ආපසු ගෙවනු ලබන රු25,000/=ක ලංසු ඇප තැන්පත් ගාස්තුවක් පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරයේ ගිණුම් අංක 71446342 දරණ ලංකා බැංකු ගිණුමෙහි තැන්පත් කර අදාළ තැන්පතු පත පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ පරිපාලන කාර්යාලයේ ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර එම අංශය වෙතින් නිකුත් කරනු ලබන ලදු පතෙහි මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.

5. අදාළ **RMU 06 සහ RMU 07 බදු පරිශ්‍රයන් දෙක**, 2025.04.02 වන දින සිට 2025.04.21 වන දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව.3.00 කාල වේලාව තුළදී පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය වෙත පැමිණ පරීක්ෂා කර බැලිය හැක.

6. නිසි පරිදි සම්පුර්ණ කරන ලද ලංසු අයදුම්පත්, 2025.04.22 වන දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන සේ

**සභාපති**
**පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරය,**
**පරිපාලන කාර්යාලය, පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය,**
**අංක 83/1, මීගහවත්ත පාර,**
**පැලියගොඩ.**

යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ, එම ලිපිනයෙහිම අංක 02 ගොඩනැගිල්ලේ පළමු මහලේ පරිපාලන කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය.

7. ලංසු පත් විවෘත කරනු ලබන අවස්ථාවේ ලංසුකරුට හෝ ඔහු විසින් බලය පැවරූ නියෝජිතයකුට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. 2025.04.22 වන දින පෙ.ව. 10.00 ට ලංසු කැදවීම අවසන් කළ වහාම ලැබී ඇති ලංසු පත්, පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ 02 ගොඩනැගිල්ලේ පළමු මහලේ පරිපාලන කාර්යාලයේ දෙවන මහලෙහි පිහිටි ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

8. ලංසුකරුවන් විසින් ලංසු බහලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ අංක 02 ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ ඇති RMU 06 සහ RMU 07 බදු පරිශ්‍රයන් දෙක බදුදීම සඳහා ලංසු කැදවීම - 2025**" යනුවෙන් සඳහන් කළ යුතුය.

9. ඕනෑම ලංසුවක් පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ අවසන් තීරණය පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරය සතු වේ.

10. මේ සම්බන්ධයෙන් වැඩිමනත් විස්තර පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ පරිපාලන කාර්යාල දුරකථන අංක 011-3301707 ඇමතීමෙන් ලබා ගත හැක.

**සභාපති**
පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරය,
පරිපාලන කාර්යාලය, පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය,
අංක 83/1, මීගහවත්ත පාර,
පැලියගොඩ.